# ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික ප්‍රඥප්තිය

(කෙටුම්පත)

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ - 07

338.98:63
(54)
ගොවි

06/2009 2010/04

125/=

16414A

16414A

පුස්තකාලය
LIBRARY
හ.ගො.ගො,ප.පු.ආ
HARTI

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

கமநல ஆராய்ச்சி பயிற்சி நிறுவகம்

**AGRARIAN RESEARCH AND TRAINING INSTITUTE**

දුරකථන / தொலைபேசி / Telephone: 696981, 696437, 698539-41

ෆැක්ස් / பெக்ஸ் / Fax: 94-1-692423

විදුලි පණිවුඩ / தந்தி / Telegrams: "ගොවි පර් පුහුණු" / "கமநலம்" / "Agrati"

තැ. පෙ. / த. பெ. / P. O. Box: 1522

114 විජේරාම මාවත, කොළඹ 7. / விஜேராம மாவத்தை, கொழும்பு 7. / Wijerama Mawatha, Colombo 7.


මගේ අංකය / எனது இல. / My No.: 9/ටවිඇම/94

ඔබගේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 26.10.94

කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අමාත්‍ය,

ගරු. දි. මු. ජයරත්න මැතිතුමා,

කෘ. ඉ. ව. සම්/ලේකම් මගින්,

ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික ප්‍රඥප්තිය.

ඔබතුමා ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට පැමිණ එම පාලක මණ්ඩලයේ සාමාජිකයින් සහ අංශ ප්‍රධානීන් ඇමතූ අවස්ථාවේදීත්, ඊට පසුව පුද්ගලිකව මා ඔබ තුමා හමු වූ අවස්ථාවකදීත් , මෙරටට නැලපෙන ජාතික කෘෂිකාර්මික ප්‍රඥප්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවය ගැන සඳහන් කරන ලදී. මේ සඳහා කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අංශ වලට අදාල පාලකයින්, විශේෂඥයින් සහ විද්වතුන්ගේ අදහස් ලබා ගත යුතුව ඇත. ඒ සියල්ලන්ගේම අවධානය යොමු වීම සඳහා අවශ්‍ය වන ඉතාමත් නියතමාති ප්‍රඥප්ති කෙටුම්පතක් මවිසින් සකස් කරන ලදී. මේ කෙටුම්පත සකස් කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස් අවුරුදු සැලැස්ම 1992 – 96, 'රාජ්‍ය ආයෝජනය ප්‍රකාශනය' සහ අදාල විවිධ පනත් ආදිය පරිශීලනය කලෙමි. ඔබතුමා අපේක්ෂා කරන ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා අදාල නිලධාරීන්ගෙන් සහ විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කොට එම ප්‍රඥප්තිය සකස් කර ඔබ තුමාට ඉදිරිපත් කිරීමට දින නියමයක් සනිටුහන් කිරීම මැනවැයි යෝජනා කරමි. එම කමිටුවේ අවධානය යොමු කරවීමට අවශ්‍ය විෂය මාතෘකා මගේ මෙම කෙටුම්පතට ඇතුලත් කර ඇත. එය සකස් කිරීමේදී මැලේසියාවේ කෘෂිකාර්මික ප්‍රඥප්තිය බෙහෙවින් උපකාරී වූ බව සඳහන් කරනු කැමැත්තෙමි.

අ.පි.බ.

18414

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
கமநல ஆராய்ச்சி பயிற்சி நிறுவகம்
**AGRARIAN RESEARCH AND TRAINING INSTITUTE**


දුරකථන / தொலைபேசி / Telephone: 696981, 696437, 698539-41
විදුලි පණිවුඩ / தந்தி / Telegrams: "ගොවි පරි පුහුණු" "கமநலம்" "Agrari"
තැ. පෙ. / த. பெ. / P. O. Box 1522
114 විජේරාම මාවත, කොළඹ 7. / விஜேராம மாவத்தை, கொழும்பு / Wijerama Mawatha, Colombo 7.
ෆැක්ස් / பெக்ஸ் / Fax: 94-1-692423
මගේ අංකය / எனது இல. / My No.
ඔබගේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date




2. වෙනත් පෙර අපර දෙදිග රටවල්වල කෘෂිකාර්මික ප්‍රඥප්තීන් ගැන විස්තර මවිසින් තවදුරටත් සමීක්ෂණය කරමින් සිටිමි. ප්‍රඥප්ති කමිටු අවස්ථාවේදී ඒවායින් ගත හැකි අභ්‍යාසය ගැන සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවෙන් සිටිමි.

3. මේ සම්බන්ධයෙන් ගොවි කටයුතු පුහුණු කිරීමේ පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන්ගේ අදහස්ද ලබා ගැනීමට කටයුතු යොදා ඇත. දැනටමත් මෙම ආයතනයේ අංශ දෙකක නිලධාරීන් තම අදහස් මා වෙත එවා ඇත. එම අදහස්ද මා සම්පාදනය කල කෙටුම්පතට ඇතුලත් කෙළෙමි.

ආචාර්ය. ඇස්. පී. සමරසිංහ
අධ්‍යක්ෂ.

තෙටුම්පත.

## ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික ප්‍රඥප්තිය.

### 1. හැඳින්වීම.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සුවිශේෂ ස්ථානයක් කෘෂිකාර්මික අංශයට හිමි වෙයි. දළ දේශීය නිෂ්පාදිතයෙහි ( GDP ) වර්ධනයට සැලෙන දායකත්වයක් ලැබෙන්නේ කෘෂිකර්මයෙනි. 1991 දී එය සියයට 25.6 ක් විය. එයින් වැවිලි කර්මාන්තයට (තේ, රබර් සහ පොල්) සියයට 7.7 ක් වෙන් වූ විට වී සහ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගෙන් (සත්ත්ව පාලනය ඇතුළුව) සියයට 18.9 ක් ලැබී ඇත. සමස්ථ වාණිජ අංශයෙන්ම ලැබී ඇත්තේ සියයට 21.0 කි. 1991 සවිස්තර සංඛ්‍යා ලේඛණ 1 වන ඇමුණුමෙහි දක්නට ඇත.

ශ්‍රී ලාංකික ජනගහනයෙන් සියයට 80 ක්ම ගම් නියම්ගම් වල වෙසෙන ගැමි ජනතාව වන අතර, බෙහෙවින්ම ඔවුන්ගේ ජීවිකා වෘත්තිය වී ඇත්තේ ගොවිතැනයි. ඒ අනුව කෘෂිකර්ම අංශයේ පරිමාණයක්, ජනගහන ප්‍රතිශතයක් ගැන සලකන විට ඒ දෙකරුණෙන්ම ගමය වනුයේ කෘෂිකර්ම අංශය කඩිනම් වර්ධනයට ලක් කල යුතු බවයි. ඒ නිසා කෘෂිකර්ම අංශයේ වැවිලි කර්මාන්තයට අයත් නොවන වී වගාව, සෙසු බෝග වගා සහ සත්ත්ව පාලනය පිළිබඳව වත්මන් රජයේ කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයට අයත් වන කාර්ය භාරයන්ට කේන්ද්‍රිය වන විෂයයන්ට අදාල වන පරිදි මේ ප්‍රඥප්තිය සකස් කෙරේ. ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියකට වැවිලි සහ ධීවර කර්මාන්තද අයත් වීම ජාත්‍යයන්තර වශයෙන් පිළිගත් සම්ප්‍රදාය බැවින් ඒවා වෙනම සකස් වුවාට පසුව ඒ සියළුම ක්ෂේත්‍රයන්හි සමස්ත සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන පරිදි ඒකාබද්ධ ප්‍රඥප්තියක් සකස් කෙරේ.

2. <u>පසුබිම</u>.

ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දින සිට අද දක්වාත්, ඊට පෙර යටත් විජිත යුගයේදීත්, කෘෂිකර්මය රජයේ සුවිශේෂ කාර්ය සාධකයක් වූ බැවින් නිදහස ලැබුණු ආරම්භයේදී කෘෂිකර්මය, අග්‍රාමාත්‍යවරුන් යටතට වැටුණු විෂයයක් වුවත් මේ දක්වා කෘෂිකර්මයට අදාල වන නිශ්චිත ප්‍රඥප්තියක් සකස් වී නැත. වෙනත් බොහෝ රටවල් වල කෘෂිකර්ම ප්‍රඥප්ති ක්‍රියාත්මක වන අතර, ඒවා බලය ලැබෙන ඒ ඒ ආණ්ඩුවලට හිතුමතේ වෙනස් කරන්නට නුපුළුවන් වන පරිදි කෙටුම්පත් කර ඇත්තේ රට, ජාතිය සඳහා වන ප්‍රඥප්ති වල අඛණ්ඩ ක්‍රියාමාර්ගය සුරක්ෂිත කිරීම සඳහාය. එහෙත් යාවත්කාලීන අවශ්‍යතා අනුව යෝග්‍ය පරිදි පරිපාලන නියෝග සංශෝධනය කිරීමට එම ප්‍රඥප්ති වලින්ම ඉඩ සලසා ඇත. අභාග්‍යකට මෙන් ශ්‍රී ලංකාවේ අද දින වනතෙක්ම අපේ අවශ්‍යතාවන්ට අනුකූලව සැකසුණු කෘෂිකර්ම ප්‍රඥප්තියක් නැත. එවැන්නකට නෑකම් කියන ලේඛන දෙකක් නම් ඇත. එයින් එකක් දැනට බොහෝ දෙනෙකුට අමතක වී ඇති එමෙන්ම ලෙහෙසියෙන් සොයා ගන්නටත් බැරි 'ජාතික කෘෂිකාර්මික, ආහාර සහ පෝෂණ උපාය මාර්ග' (National Agriculture, Food and Nutrition Strategy (NAFNS) ). යන ලේඛණයයි. අනෙක වර්ෂයක් පාසා පල කරනු ලැබූ 'රාජ්‍ය ආයෝජනය' ප්‍රකාශනයයි. එය 14 වැනි වරට පල කලේ 1992 ඔක්තෝබර් මාසයේදීය. 'රාජ්‍ය ආයෝජනය ' ප්‍රකාශනය සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය විසින් සම්පත් වෙන් කරනු ලබන ආකාරය සහ ඊට පදනම් වූ සාර්ව-ආර්ථික හා අංශීය ප්‍රතිපත්ති ( Macro-economic and Sectoral Policies ) පැහැදිලි කිරීම පිණිස වාර්ෂිකව සකස් කෙරෙන්නෙකි. එම ප්‍රකාශනයෙහි කෘෂිකර්මය පිළිබඳව ප්‍රතිපත්ති දක්වා ඇත්තේ ඉතා සුළුවෙනි. එබැවින් එය කෘෂිකාර්මික ප්‍රඥප්තියක් සේ කිසිසේත්ම සැලකිය නොහැකිය. මීට අමතරව කෘෂිකර්මය, ඉඩම් සහ වන සම්පත් විෂයයන් අදාල ආඥා පනත් ( Ordinances ) පනත් ( Acts ) උපකාර නීති( Subsidiary Legislations ) කැබිනට් තීරණ සහ ඒ අනුව නිකුත් කර ඇති පරිපාලන නියෝග සමුදායෙන් මතුවන ප්‍රතිපත්තිමය මූලධර්ම රාශියක් ඇත.

ඉහත සඳහන් පළමු ලේඛනය 1984 දී ප්‍රකාශිත වූ අතර, එයින් රටේ කෘෂිකාර්මික ප්‍රඥප්තියක මූලික ලක්ෂණ සඳහන් කර ඇත. ඒවා මෙසේයි:

1. මූලික ආහාර එනම් සහල්, කිරි, සීනි, මාළු සහ ධාන්‍ය වර්ග වලින් ස්වයංපෝෂිත වීම.
11. ජාත්‍යන්තර ගෙවුම් තුලනයට දායකත්වය වීම සඳහා කෘෂි නිෂ්පාදන අපනයන ශක්‍යතාවය වර්ධනය කිරීම
111. ගැමි ක්ෂේත්‍රයේ ආදායම් තත්ත්වය නව රැකියා නියුක්තීන් සඳහා වැඩි දියුණු කිරීම.
1V. මහජනයාගේ පෝෂණ තත්ත්වය දියුණු කිරීම.

මෙයින් සහල් නිෂ්පාදනය ගැන පමණක් සෑහීමට පත්වසිටි අතර, අතිරික්තය අපනයනය කරන උපාය මාර්ග ගැන සෙවීමේ නිරත වූ බව පෙනේ. ඒ අනුසාරයෙන් වී වගාව විවිධාංගීකරණය කර පෝෂ්‍ය ආහාර නිෂ්පාදනය ගැනද ඒ වකවානුවේදී යෝජනා ඉදිරිපත් විය. සීනි වලින් ස්වයංපෝෂිත වීමේ ලකුණුද පහල විය. වෙරළාසන්න මාලු නිෂ්පාදනය වර්ධනය වූ අතර, සාගර මධ්‍ය ධීවර කටයුතුත් මිරිදිය මසුන් වර්ධනය කිරීමත් ගැන රජයේ අවධානය යොමු විය.

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට ප්‍රමුඛතාවත් ලබා දීමෙන් සත්ත්ව පාලන නිෂ්පාදන වාණිජ්‍ය තලයකට ගෙන ඒමේ වෑයමක් දරන ලදී. කෘෂියාදන කර්මාන්තයන් ගොවිපලින් බැහැර රැකියා නියුක්තියක් බවට පරිවර්තනය කිරීමේ ස්වයං රැකියා උපාය මාර්ගයක් වශයෙන් සලකා ඇත. ගොවීන් තුල පාරම්පරිකව වී ගොවිතැනට තිබුණු නැඹුරුවත් ඒ සඳහා ස්ථාපිතව තිබුණු ප්‍රමුඛතාවත් නිසා සියළුම සෙසු බෝග වර්ග වගාව ඊට දෙවැනි තැනක් ගත්තේය.

රාජ්‍ය අංශයේ කෘෂිකර්ම ආයතන විසින් සංවර්ධන සැලසුම් සහ කලමනාකරණය කෙරෙහි දැක්වූ උදාසීනබාවය මෙම සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීමට එරෙහිව සිටීම මේ සම්බන්ධයෙන් උද්ගත වූ ප්‍රධාන බාධකයක් විය. එබැවින් කර්මාන්ත ක්ෂේත්‍රයට මෙන් පුද්ගලික අංශයටද කෘෂිකර්ම ක්ෂේත්‍රයට සහභාගී වන ලෙස ආරාධනය කරන ලදී.

මෙය ප්‍රතිපත්තියක් වශයෙන් ඉතා පැහැදිලි ලෙස '1992–1996 රාජ්‍ය ආයෝජන 'ප්‍රකාශනයේ සඳහන් වන්නේ මෙසේය:

2.03 මෙම කෘෂි උපාය මාර්ගයේ ප්‍රධාන තේමාව වනුයේ එහි වර්ධනය සහ ආයෝජනය කෙරෙහි පෞද්ගලික අංශයේ සහභාගිත්වයට තුඩු දෙන වාතාවරණයක් ඇති කෙරෙමින් සංවර්ධන ක්‍රියාවලිය පහසු කරවීමට පමණක් රජයේ මෙහෙය සීමා කිරීමයි.

2.04 රට තුල කර්මාන්ත සහ සේවා අංශයන් දියුණු වන විට ජාතික නිෂ්පාදනයට අයත්වන කෘෂිකාර්මික දායකත්වයෙහි ස්වාභාවික අඩුවීමක් සිදු විය යුතුය. (අවධාරණය මාගේය)

මෙයින් අදහස් කෙරෙන්නේ කුමක්ද? දළ දේශීය නිෂ්පාදිතයෙන් සෑහෙන ප්‍රතිශතයක් කෘෂිකර්මයෙන් (වැවිලි කර්මාන්ත නොමැතිව) ලැබෙද්දී ඒ සම්පත අනුක්‍රමිකව පුද්ගලික අංශයට නැඹුරු කරවීමක්ද යන සාධාරණ සැකය මතුවෙයි. එසේ වුවහොත් දැනටමත් දුගී දුප්පත් බවට පරිවර්තනය වී ඇති ගැමි ගොවියා තවත් පීරිහෙනු නොඅනුමානයි. ඒ නිසා දැන්වත් ගොවිතැන දියුණු කිරීම වාණිජ්‍ය මෙන්ම පාරම්පරික ගැමි වෘත්තියක තුලනය මත ස්ංස්කරණයක් වුවත් විය යුතු බව අවධාරණය කෙරේ.

මේ පසුබිම යටතේ කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයට අයත් විෂයයන්ට අදාල වූ එනම් මේ රටේ ගොවිතැන ගැන ජාතික ප්‍රඥප්තියක අවශ්‍යතාවය අන් කවරදාවකටත් වඩා අද ඉස්මතු වී ඇත. එය ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සඳහන් කරන පරිදි හැකිතාක් දුරට ධරණීය සංවර්ධනයක් විය යුතුයි. ( Sustainable Development )

ධරණීය සංවර්ධන සංකල්පය ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් නිර්වචනය කර ඇත්තේ මෙසේයි.:

" සමකාලීන සහ අනාගත පරම්පරාවන්ගේ මනුෂ්‍ය අවශ්‍යතා නිරතුරුව සපුරාලීම සඳහා සහතික වීමට අවශ්‍ය වන පරිදි තාක්ෂණික සහ ආයතනික වෙනස්වීම් ගැලපීමත්, ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන්නා වූ සම්පත් සමුදාය තත්ත්වාවබෝධයෙන් යුතුව කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීමත්ය "

(ආහාර සහ කෘෂිකර්ම සංවිධානය : 1992 )

මෙම ජාත්‍යන්තර නිර්වචනය නව රජයේ පොදු අභිප්‍රේතාර්ථයන්ට කිසිදු අයුරකින් වෙනස් නොවේ. ඒ දෙසංකල්පයෙහිම සමුදාර්ථය මේ ප්‍රඥප්තියට පාදකවනු ඇත.

3. <u>ජාතික කෘෂිකාර්මික ප්‍රඥප්තිය.</u>

සටහන: පහත සඳහන් වන ප්‍රතිපත්ති මාලාව එකින් එක තවදුරටත් අධ්‍යයනය කර අවශ්‍ය නිර්දේශ පිළිබඳව ඒ ඒ දෙපාර්තමේන්තු සහ ආයතන වල එකඟත්වය ඇතිව සම්මුතියකට එළඹිය යුතුයි. අදාල විෂයයන්ට සම්බන්ධිත පරිපාලකයින්, අර්ථ ශාස්ත්‍රඥයින්, විද්‍යාඥයින්, තාක්ෂණිකයින් සහ සෙසු විද්වතුන්ගේ නව චින්තනයන් අනුව මේ ප්‍රතිපත්තින් සංශෝධනය විය යුතුයි. <u>ඒ නිසා මේ කෙටුම්පත හුදෙක් සාකච්ඡාව සඳහා සකස් වූවක් බව අවධාරණය කළ යුතුය.</u>

ශ්‍රී ලංකාවේ ඉඩම්, ජල, දේශගුණය සහ වන සම්පත් වලින් ලබාගත හැකි උපරිම ප්‍රයෝජනය තව දුරටත් වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පාරම්පරික ඥානය සහ නව තාක්ෂණය එකිනෙකට ගැලපීමෙන් අර සම්පත් සමුදාය මගින් කෘෂි ක්ෂේත්‍රයට නව ජීවනයක් ලබා දීමෙන් රටේ සමස්ථ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම ප්‍රඥප්තියේ පළමුවන අරමුණයි.

දෙවැනිව දැනට ඇති සම්පත් වලින් දුගී දුප්පත් ජනතාවගේ දුගී බව තුරන් කිරීම අර සමස්ථ සංවර්ධනයේ ඍජු ප්‍රතිඵලය බවට සහතික විය යුතුයි. එහි අතුරු ඵලය වනුයේ දුගී දුප්පත් ගොවී ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමෙන්ද ජීවන රටාව රටේ සංස්කෘතියට අනුකූලව සංස්කරණය වීමෙන්ද සමාජ–ආර්ථික–සංස්කෘතික වර්ධනයකට කේන්ද්‍රියවන සාධක සහ වාතාවරණය නිරායාසයෙන්ම ඇතිකරලීමයි. ඒ තුන්වැනි අරමුණයි.

සතරවැනිව එවැනි වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන අංශයන් ( Development Sectors ) හඳුනාගැනීම සහ දේශීය සහ නව තාක්‍ෂණ යාන්ත්‍රිය මගින් නව නිර්මාණ සැලසුම් ( Innovative Modalities ) සකස් කිරීම, ධරණීය සංවර්ධනය, ස්වාභාවික සහ මානව සම්පත් වර්ධනය සඳහා ඉතා සමීප සම්බන්ධීකරණයක් ඇතිකල යුතුයි.

4. <u>උපාය මාර්ග සංග්‍රහය</u>( Strategy Formulation )

ඉහත සඳහන් අභිප්‍රේතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා තිබෙන සම්පත් පිළිබඳව ඓතිහාසිකව මෙන්ම සාවත්කාලීනව එළඹෙන බාධක නිරීක්‍ෂණය කිරීමෙන් ඒවා විසඳමින් ඉදිරියට යාමට තරම් ශක්‍යතාවයක් ඇති උපාය මාර්ග සංග්‍රහයක් සම්පාදනය කල යුතුය. ඒ සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ.

1. පූර්ණ කෘෂිකර්ම ක්ෂේත්‍රය අවුරුදු පහෙන් පහට සාර්ව සමීක්ෂණයකට( Macro - Survey ) ලක් කල යුතුය. ඒ අතර ගොවිතැනෙහි නියැලෙන ගොවි ජනතාවගේ සමාජ ආර්ථික සහ සංස්කෘතික ව්‍යුහය පිළිබඳ කරනු ලබන සූක්ෂම සමීක්ෂණ( Micro - Survey ) මගින් ඔවුන්ගේ කාලීන ප්‍රශ්න හඳුනාගෙන ඒ සඳහා පුළුබතාවත් නිර්ණය කල යුතුය.

කාලය සහ ජීවිතය සමග සටනක යෙදී සිටින ගොවීන්ට සංවර්ධන කටයුතු පැරණි පුරුදු කාලයට සිදු වන්නට ඉඩ හැර බලා සිටීමට නොහැකිය. ඒ නිසා මේ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කරනු ඇත.

11. කෘෂිකර්මයට විශේෂිත ප්‍රශ්න පිළිබඳව නිරතුරුවම අවධානයෙන් සිටීමත්, එසේ හඳුනාගනු ලබන ප්‍රශ්න සහ විෂයයන් පිළිබඳව රාජ්‍ය අංශවලට පැවරී ඇති වගකීම තව දුරටත් ශක්තිමත් කෙරේ. උදාහරණ වශයෙන්: බිත්තර වී සහ සෙසු බෝග බීජ නිෂ්පාදනය සහ සැපයීම සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සහ නඩත්තුව, පොහොර සැපයීම හා භාවිතය, කෘෂි නිෂ්පාදන අලෙවිය ආදී වශයෙන් ඒ ඒ කාර්යයන් භාර ආයතන වල ආයතනික අංග සැලසුම ( Institutional Planning ) විධිමත් කෙරේ.

ඉහත (1) සහ (11) ට ආනුෂංගික සාධකයන් වන

1. වී ගොවිතැන.
2. සෙසු බෝග වර්ග සහ නිර්යාත බෝග
3. බීජ සහ වැවිලි ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය
4. මානව සම්පත්
5. ස්වාභාවික සම්පත් පිළිබඳ පර්යේෂණ සහ කළමනාකරණය
6. ව්‍යාප්ති සහ සංනිවේදනය
7. කෘෂි යන්ත්‍රෝපකරණ සහ උපකරණ
8. කෘෂිකර්මය සම්බන්ධිත සමාජ ආර්ථික සහ සංස්කෘතික පර්යේෂණ

ආදිය ගැන නිශ්චිත ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කෙරේ.

## (1) වී ගොවිතැන පර්යේෂණ සහ සංවර්ධනය.

දිවයිනේ තිබෙන වගා තල ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර් මිලියන 3 කි. එයින් හෙක්ටෙයාර් 800,000 ක පමණ වී වගා කෙරේ. 1992 මුළු වී නිෂ්පාදනය වී මෙට්‍රික් ටොන් මිලියන 2.3 කි. (සහල් මෙ.ටොන් මිලියන 1.6) පරිභෝජනය සඳහා පමණක් සහල් මෙට්‍රික් ටොන් 1.8 දැනට අවශ්‍ය වේ. වර්ෂ 2000 වන විට මිලියන 20 ක පමණ ජනගහණය සඳහා සහල් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් මිලියන 1.8 සිට 2.1 දක්වා වැඩිවනු ඇත.

දැනට ගොවි පවුල් 700,000 ක් පමණ ඇත. ඔවුන්ගේ ප්‍රධාන ජීවිකා වෘත්තියද ගොවිතැනයි. අනාගතයේදී ඔවුන්ගේ සමාජ ආර්ථික සහ සංස්කෘතික තත්ත්වය තව දුරටත් වර්ධනය තල යුතුය. මේ කරුණු අනුව වර්ෂ 2000 වන විට දැනට ඇති වී වගා ඉඩම් ප්‍රමාණය වැඩි විය යුතු අතරම, දැනට ඇති වී නිෂ්පාදන හෙක්ටයාර් ධාරිතාවය 3.2 සිට අවම වශයෙන් 5.00 දක්වා වර්ධනය විය යුතුය.

මේ අනුව සහල් නිෂ්පාදනයේ වර්ධනයත් එය රඳා පවත්වා ගැනීමත් සහල් මිල සාධාරණ මට්ටමකට ගෙන එන අතර, ගොවිතැන ලාභශීලී රැකියාවක් බවට පරිවර්තනය කිරීමත් අපේක්ෂා කෙරේ.

මේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට එරෙහි වූ බාධකයන් හැටියට පහත සඳහන් ප්‍රශ්න හඳුනාගෙන ඇත.

1. යෝග්‍ය බීජ වර්ග අඩුවීම.
11. යෝග්‍ය ශස්‍ය විද්‍යා ක්‍රියාක්‍රමය අඩුවීම.
111. පසෙහි නිෂ්පාදන ශක්‍යතාවය ක්‍රමයෙන් ක්ෂය වීම
1V. බෝග ආරක්ෂණය ප්‍රමාණවත් නොවීම.
V. අස්වනු සහ පසු අස්වනු තාක්ෂණය ප්‍රමාණවත් නොවීම.
V1. ව්‍යාප්ති සේවාවන් ප්‍රමාණවත් නොවීම.
V11. සමාජ ආර්ථික බාධක මතුවීම.

VIII. ගුණාත්මක බීජ වර්ග නොපිහීම.

IX. යෝග්‍ය ගොවි ශක්තිය නැතිවීම.

X. අයෝග්‍ය ජල කළමනාකරණය.

ඉහත සඳහන් සෑම බාධකයක්ම ජය ගැනීම සඳහා අදාල ආයතන විසින් ඒ ගැන අධ්‍යයනයක් කර පස් අවුරුදු සැලැස්මක් සකස් කෙරේ. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මානව සම්පත් සහ කළමනාකරණය සැපයෙන අතර, එහි ක්‍රියාකාරිත්වය සහ සැලැස්මෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කෙරේ.

(2) <u>සෙසු ක්ෂේත්‍ර බෝග වර්ග සහ නිර්යාත බෝග:</u>

සෙසු බෝග වර්ග වලට අයත් වන එළවළු, පලතුරු, අල වර්ග ආදියෙහි වාර්ෂික අගය බිලියන 19.8 ක් පමණයැයි ගණන් බලා ඇත. මෙම බෝග වර්ගවල එළදාවද අතිශයින් සතුටුදායකය. පලතුරු වල එළදාව හෙක්ටයාර් එකකට ටොන් 7 ක් පමණ වන අතර, එළවළු වල එළදාව ටොන් 8 ක් පමණ වේ. වී වගා එළදාව ටොන් 3.5 කි. වෙනත් අයුරකින් සඳහන් කරන්නේ නම් සෙසු ක්ෂේත්‍ර බෝග හෙක්ටයාර් 200,000 කින් ලැබෙන ආදායම වී ගොවිතැනින් ලබා ගැනීමට හෙක්ටයාර් 800,000 ක කුඹුරු අවශ්‍ය වේ.

පලතුරු සහ එළවළු නිර්යාත ආදායම 1979 දී රුපියල් බිලියන 29 ක් වූ අතර, එය 1991 වන විට 584 දක්වා වර්ධනය විය.

අපනයනට අමතරව මෙරට පෝෂ්‍යාහාර වශයෙන් පරිභෝජනය සඳහා සෙසු ක්ෂේත්‍ර බෝග වර්ග විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ. මෙම බෝග සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ත්‍රිවිධ ක්‍රියාදාමයක් යෝජනා කෙරේ. එනම් පරිසරයානුකූල තාක්ෂණය වර්ධනයෙන් එළදාව දියුණු කිරීම, එම බෝග තත්ත්වය සහ ලාභය තහවුරු කිරීම සහ පසු අස්වනු අලාභය අඩු කිරීමත්ය.

මේ සඳහා මතුවී ඇති ප්‍රධාන බාධක මෙසේය.

1. යෝග්‍ය වැවිලි ද්‍රව්‍ය සහ ඒවාට අනුරූපවන තාක්ෂණය අඩුවීම.
11. සුදුසු සහ ප්‍රබල ව්‍යාප්ති සේවා සහ සම්බන්ධීකරණ අඩුවීම.
111. පලිබෝධ සහ සෙසු රෝග වර්ග අධික වීම.
1V. පසෙහි සාරවත් භාවය අඩුවීම.
V. පසු අස්වනු ආරක්ෂාව සඳහා අවශ්‍ය තාක්ෂණය නැතිවීම.
V1. අවශ්‍ය තොරතුරු මධ්‍යස්ථාන නැතිවීම.

සෙසු ක්ෂේත්‍ර බෝග වර්ග අතර, ප්‍රධාන තැනක් ගන්නේ මිරිස්, රතුළූනු, ලොකු ළූනු, මුං ඇට, කව්පි, සෝයා බෝංචි, පරිප්පු , රටකජු, තල, ඉරිඟු සහ කුරක්කන්ද අල බෝග වන අර්තාපල්, බතල සහ මංඤොක්කා ආදියයි. නිර්යාත බෝග වශයෙන් කරාබු, එන්සාල් ආදිය ගණන් ගැනේ.

අස්වැද්දුම් කල එහෙත් ජලය නොමැති නිසා වගාවන් නොකෙරෙන ඉඩම් හෙක්ටයාර් 445,000 දැනට තිබෙන බව ඇස්තමේන්තු කර ඇත. මෙයේ වී ගොවිතැනට යෙදවීමට අපහසු තත්ත්වයක් ඇති ඉඩම් ප්‍රමාණය සෙසු බෝග වගා සඳහා යෙදවීමට අපේක්ෂා කරේ.

සෙසු ක්ෂේත්‍ර බෝග වර්ග සහ නිර්යාත බෝග වර්ග සඳහා දැනට මුහුණ දෙන ඇති බාධක මගහරවා ඒවාහි සංවර්ධනය සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කෙරේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ සම්පත් සැපයෙන අතර, ඒ සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කෙරේ.

(3) <u>බීජ සහ වැවිලි ද්‍රව්‍ය:</u>

බිත්තර වී සහ සෙසු ක්ෂේත්‍ර බෝග වර්ග පලතුරු, එලවළු ආදිය සඳහා අවශ්‍ය බීජ සහ වැවිලි ද්‍රව්‍ය පිළිබඳ අවශ්‍ය පර්යේෂණ කරමින් වැඩි ඵලදාව ඇති රෝපණ ද්‍රව්‍ය සපයාදීම සහතික කෙරේ.

දැනට රටට අවශ්‍ය වාර්ෂික බිත්තර වී ප්‍රමාණය බුසල් මිලියන 4.4 කි. මෙයින් බුසල් 200,000 ක් රජයේ ලියා පදිංචි සහ සහතික බිත්තර වී වන අතර, ඒවා රජයෙන් නිකුත් කරනු ලැබේ. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අවශ්‍ය යෙදවුම් ( Inputs ) වලින් ප්‍රධාන තැනක් ගන්නේ රෝපන ද්‍රව්‍යයි. එහි ප්‍රබලත්වය වර්ධනය වූ තරමට ඵලදාව සහ ආදායම වැඩිවේ.

එනම් ගොවි පවුල් 700,000 ක පමණ ආදායම් මට්ටම ඉහල යාමයි. එබැවින් බීජ සහ රෝපණ ද්‍රව්‍ය වර්ධනය කිරීම රජය, රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලික ක්ෂේත්‍රයන් මගින් ඉටු කිරීම අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ආයතන මගින් නිකුත් කෙරෙන බීජ සහ රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය සීමිත බැවින් බොහෝ ගොවියන් දැනට භාවිතා කරනුයේ අඩු අස්වැන්නක් දෙන රෝපන ද්‍රව්‍යයි. මෙය ජාතික ආහාර නිෂ්පාදනයට අහිතකර වන බැවින් වැඩි දියුණු කරන ලද ඵලදායි රෝපණ ද්‍රව්‍ය ඔවුන්ට අවශ්‍ය තරම් අවශ්‍ය කාලයේදී නොපමාව ලබා දීමෙන් ගොවිතැන් වතුයට අනුකූලව වගා කිරීමෙන් ආර්ථික වාසි ලබා ගත හැකිය. ඒ නිසා එවැනි රෝපන ද්‍රව්‍ය අවශ්‍ය කාලයේදී සාධාරණ මිලකට ලබා දීමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා මතුවිය හැකි බාධක මෙසේය:

1. බීජ සහ රෝපන ද්‍රව්‍ය පිළිබඳ ප්‍රතිපත්තියක් නොමැතිවීම.
11. බීජ සහ රෝපන ද්‍රව්‍ය කර්මාන්තය පිළිබඳව සම්බන්ධීකරණයක් නොමැතිවීම.
111. මූල්‍යමය සම්පත් අඩුවීම.
1V. බීජ සහ රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථාන නොමැති වීම.

V. බීජ සහ රෝපණ ද්‍රව්‍ය පිළිබඳ පනතක් නොමැති වීම.

VI. බීජ සහ රෝපණ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ අඩුවීම.

VII. බීජ සහ රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම දුර්වලවීම.

මීට අමතරව රෝපණ ආරක්ෂණය, කෘමිනාශක බෙහෙත් පාලනය සහ බීජ ද්‍රව්‍ය සහතික කිරීමද රජයේ වගකීමක් වනු ඇත.

(4) මානව සම්පත් සංවර්ධනය.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍යයෙන්ම උවමනා කරන මිනිස් සම්පත් වනුයේ විද්‍යාඥයින්, ව්‍යාප්ති සේවකයින්, කාර්මිකයින්, කළමනාකරුවන් සහ ඒ සියල්ලටම වඩා ගොවීන් සහ ගොවිතැනට ඉදිරිපත් වන සෙසු ව්‍යවසායික ප්‍රජාවයි. ඒ නිසා සැලසුම් කරනු ලබන මානව සම්පත් වර්ධනයත් කෘෂිකර්ම සංවර්ධනයට අත්‍යවශ්‍ය වනු ඇත. එහෙත් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම, පුහුණු කිරීමේ අවශ්‍යතා පිළිබඳව නිශ්චිත අවබෝධයක් නොමැතිවීම සේවයේ සිටින නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික පුහුණුව නොලැබීම ප්‍රධාන බාධක වශයෙන් සැලකේ. මේ සඳහා සැලසුම් කරනු ලබන පස් අවුරුදු සැලැස්මෙන් මෙකී ඌනතාවන් සපුරා ගැනීම අපේක්ෂා කෙරේ. මේ පිළිබඳව ව්‍යුහාත්මක අධ්‍යයනයන් කර යථා පරිදි ක්‍රියාවට යොමු කිරීමත්, ඒ ගැන නිරතුරු අධීක්ෂණයක යෙදීමත් අවශ්‍යවනු ඇත.

(5) ස්වාභාවික සම්පත් කළමනාකරණය.

ධරණීය කෘෂිකර්ම සංවර්ධනය සඳහා ඉඩම් සංරක්ෂණය සහ ජල පාලනයට අදාල තාක්ෂණ ඥානය සැපයීම අවශ්‍යවනු ඇත. සියළුම කෘෂි දේශගුණ ප්‍රදේශවල පස සහ ජලය සංරක්ෂණය අරභයා අවශ්‍ය වන්නාවූ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. ඉඩම්වල සශ්‍රීකත්වය රැකා පවත්වා ගැනීමටත් සෝදා පාලුව( Degradation ) බෙලහීන කිරීමටත් පියවර ගැනේ.

ඒ අනුව කෘෂිකාර්මික ධරණීය සංවර්ධනය සඳහා ඉඩම් සහ ජල සංරක්ෂණය සහ කලමනාකරණ තාක්ෂණය වර්ධනය කර ප්‍රසාරණය කිරීමට කඩිනමින් පියවර ගැනේ.

මේ සඳහා මුහුණ දීමට වන බාධක දැනටමත් හඳුනාගෙන ඇත. ප්‍රධානතම බාධකයන් මෙසේය:

1. ස්වාභාවික සහ භෞතික සම්පත් අඩුවීම.
11. නිශ්චිත තොරතුරු මධ්‍යස්ථානයන් නැතිවීම.
111. සංරක්ෂණ විධීන් පිළිබඳව ගොවීන් විසින් අනුගමනය කල යුතු සංරක්ෂණයේ තාක්ෂණය ගැන ඔවුන් තුල ඇති අල්ප දැනුම.
1V. අවශ්‍ය තරමට ව්‍යාප්ති සේවකයින් නොසිටීම.

මෙම දුර්වලතාවන් මග හරවා ගැනීම සඳහා පහත සඳහන් පියවරයන් ගැනේ.

1. ධරණීය කෘෂිකර්ම සංවර්ධනය සඳහා ඉඩම් සංරක්ෂණ සහ ජල කලමනාකරණ තාක්ෂණය දියුණු කිරීම සහ ප්‍රචලිත කිරීම.
11. කෘෂිකාර්මික ඉඩම් පරිහරණ සැලසුම් සඳහා අදාල ඉඩම් ජල සම්පත් සහ කෘෂි දේශගුණ දත්ත බැංකු පිහිටුවීම.
111. 1951 පස් සංරක්ෂණ පනත යටතේ ඇති පස් සංරක්ෂණ වැඩ සටහන විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම.

මේ සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඇති අතර, එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුල්‍ය සහ සෙසු ප්‍රතිපාදන සැලසේ. එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කෙරේ.

පුස්තකාලය
LIBRARY
18116 A

(6) <u>ව්‍යාප්ති සහ සංනිවේදනය:</u>

කෘෂි ක්ෂේත්‍රයට අදාල සියළුම ආයතන, විශේෂයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන, ප්‍රාදේශීය ව්‍යාප්ති සේවා සංවිධාන, රාජ්‍ය නොවන ආයතන සම්බන්ධ කර ගනිමින් ව්‍යාප්ති සේවාවන් විධිමත් කිරීම අපේක්ෂා කෙරේ. මේ අරබයා අවශ්‍ය තොරතුරු එක් රැස්කිරීම කලමනාකරණය සහ සංනිවේදනය ගැන අවධාරණය කෙරෙනු ඇත.

මේ අරමුණ සාක්ෂාත් කිරීම සඳහා මතුවිය හැකි ප්‍රධාන බාධකයන් මෙසේ හඳුනා ගෙන ඇත.

I. ව්‍යාප්ති සේවාව පිළිබඳ නිරතව සිටින විවිධ රජයේ ආයතන, පලාත් සභා ආයතන, සංවිධාන සහ රජයේ නොවන සංවිධාන වලින් ඉටුවන කාර්යයන් සම්බන්ධීකරණය නොවීම.

II. දැනට විවිධ ආයතන මගින් ඉටුවන ව්‍යාප්ති සේවාවන් බෙහෙවින් අපැහැදිලි තත්ත්වයක තිබෙන බැවින් ඒ ගැන පැහැදිලි තත්ත්වයක් නැතිවීම.

III. කෘෂි නිෂ්පාදන සහ ඒවා පරිහරණය කිරීම ගැන තාක්ෂණය අධි වේගයෙන් දියුණුවන බැවින් ඒ දැනුම් සමුදාය අවසානයේදී යොමු විය යුතු ගොවියා වෙත ලබා දීමට ඇති බාධක එකින් එක ගැන සොයා නොබැලීම.

මේ බාධක මගහරවා ගැනීමේ අරමුණ ඇතිව කෘෂි ව්‍යාප්ති සේවාව සහ කෘෂි ව්‍යාප්ති සේවා සංනිවේදනය සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඇත. එය ක්‍රියාත්මක කිරීම සහ එහි අධීක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය සහ සෙසු ප්‍රතිපාදන සලසනු ලැබේ.

(7) <u>කෘෂි යන්ත්‍රෝපකරණ සහ උපකරණ.</u>

මෙරට සමාජ ආර්ථික වුහයට අනුරූපවන පරිදි කෘෂි යන්ත්‍රෝපකරණ සහ උපකරණ භාවිතය සකස්විය යුතුය. ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ගයන් මෙසේයි:

1. දිවයිනේ නොයෙක් ප්‍රදේශවල විවිධ ගොවිතැන් ක්‍රමවලට අනුරූපවන්නා වූ පරිදි ගොවිතැන, යාන්ත්‍රික කරවීමේ අරමුණ ඇතිව ඊට පිවිසෙන ගොවීන්ගේ අවශ්‍යතා සලකා බලනු ලැබේ.

11. මෙරටට ආනයනය කරන විවිධ යන්ත්‍රෝපකරණ සහ උපකරණවල නිෂ්පාදනය, ක්‍රියාකාරිත්වය ආර්ථික සමාජයීය සහ පරිසරාත්මක ආදිනව ගැන විමසිලිමත් වනු ඇත.

111. අත්‍යවශ්‍ය වන පරිදි දේශීය පරිසරයට සහ ගොවියාගේ හුරුවට අනුකූලවන පරිදි කෘෂි යන්ත්‍රෝපකරණ සංස්කරණය කිරීම හෝ වෙනස් කිරීම ආදිය ගැන ක්‍රියාශීලි වීම.

1V. මෙරටට සුදුසු යයි නිගමනය කරනු ලබන යන්ත්‍රෝපකරණ සංයුතිය පිළිබඳ තාක්‍ෂණය දේශීය නිෂ්පාදකයින්ට ලබා දී ඒවා මෙරටෙහිම නිෂ්පාදනය කරවීමට සැලැස්වීම.

V. එසේ අනුමත කල දේශීය යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට රජයේ ව්‍යාප්ති සේවාවන්ගේත් විවිධ සංවර්ධන ආයතනවලත්, රාජ්‍ය නොවන සංවිධානවලත් සහාය ලබා ගැනීම.

V1. නව තාක්‍ෂණය ඉදිරියේ පාරම්පරික ගොවිතැන් ක්‍රම සහ ඔවුන්ගේ තාක්‍ෂණය අභාවයට යා නොදී ඒ දෙතාක්‍ෂණයෙහිම සංයුතියක් මෙරට ගොවීන්ට සහ අප සම්ප්‍රදායට ගැලපෙන තාක්‍ෂණයන් සඳහා පර්යේෂණ පැවැත්වීම . අපේ පැරණි ගොවීන් අනුගමනය කල සම්ප්‍රදායික සිරිත් විරිත් කෙම් ක්‍රම සහ ගොවිතැනෙහි ජනශ්‍රැතියට සහ ජන ජීවිතයට කේන්ද්‍රිය වූ පාරම්පරික ඥාන සම්භාරය ගැන කරුණු රැස්කිරීම සහ ගවේෂණයෙහි යෙදීම.

මේ සඳහා සකස් වී ඇති පස් අවුරුදු සැලැස්ම අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සහ සම්පත් සපයනු ඇත. එහි ක්‍රියාදාමය පිළිබඳ අධීක්‍ෂණය කෙරේ.

## (8) කෘෂිකර්මයට සම්බන්ධිත සමාජ ආර්ථික සහ සංස්කෘතික පර්යේෂණ.

ශ්‍රී ලංකාවේ දැනට වෙනස් වන ආර්ථික සමාජයීය සහ සංස්කෘතික පසුබිම යටතේ ගොවියාට ඉදිරි අනාගතයෙහිදී මුහුණ පාන්නට වන අභියෝගයන් ගැන විමසිලිමත්ව පර්යේෂණ පැවැත්වීම අපේක්ෂා කෙරේ. විවෘත ආර්ථිකය යටතේ පාරම්පරික කෘෂිකර්මයට මුහුණපාන්ට වන ගැටළු, පුද්ගලික අංශය විශාල ව්‍යවසායන් මගින් කෘෂිකර්මයට ප්‍රවේශ වීම, ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් කෘෂි ක්ෂේත්‍රයට බලපාන විවිධාකාර මාර්ග ආදිය ගැන හැකි සෑම දෘෂ්ටි කෝණයකින්ම බැලීම අවශ්‍ය වනු ඇත.

මේ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීමට දැනටමත් විවිධ රාජ්‍ය ආයතන මගින්ද රාජ්‍ය නොවන ආයතන මගින්ද බොහෝ විට ජාත්‍යන්තර සංවිධාන මගින්ද පර්යේෂණ, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය සිදු කෙරේ. ඒවාහි සමුදාර්ථය ගොවීන්ගේ යහපත සඳහා යොමු කරවීම මෙතෙක් සිදු වී නැත. ඒ කාර්යය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.

මේ කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් සැලැස්ම ක්‍රියාත්මක කෙරේ.

1. රාජ්‍ය හා රාජ්‍ය නොවන සෑම ආයතනයකින් කෘෂිකර්මයට අදාලව කෙරෙන පර්යේෂණ, වැඩමුළු, සම්මන්ත්‍රණ, දේශන ආදියෙහි ප්‍රකාශිත වාර්තා සහ ප්‍රකාශ නොවුණු වාර්තා පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයක් ඇති කිරීම. මේ සඳහා පාර්ලිමේන්තු පනතින් වගකීම පැවරීම දැනටමත් 1972 ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ පනතින් එම ආයතනයට පැවරී ඇත. එය යථා පරිදි විධිමත් කෙරේ.

11. දැනටමත් ප්‍රකාශිත වාර්තා ආදියෙන් ද ඉදිරියේදී යෝජිත පර්යේෂණවල ප්‍රතිඵල වලින්ද ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා වන පර්යේෂණ ප්‍රතිඵල මාසිකව ප්‍රකාශයට පත්කිරීම.

111. එසේ ඉදිරිපත් කෙරෙන පර්යේෂණ ප්‍රතිඵල වලින් ලැබුණු ප්‍රයෝජන ගැන ත්‍රෛමාසිකව රජයට වාර්තා කිරීමට පියවර ගැනේ.

1V. ශ්‍රී ලාංකික හෝ විදේශීය ආයතන සම්බන්ධ කර ගෙන හෝ තනිවම හෝ ගොවි කටයුතු පර්යේෂණයට අදාල පුහුණු පාඨමාලා සහ එම පහසුකම් සලසා දීම. ඊට අදාල ඩිප්ලෝමා , උපාධි සහතික, ත්‍යාග සහ සම්මාන පිරිනැමීමට ක්‍රියා කෙරේ.

V. ගොවි කටයුතු ව්‍යුහය පිළිබඳව සහ ඊට අදාල ප්‍රශ්න සම්බන්ධයෙන් ආසියානු රටවල්වල සහාය ඇතිව පර්යේෂණ පැවැත්වීම සහ ඔවුනොවුන්ට අවශ්‍ය කරුණු ගැන තොරතුරු එකතු කිරීම සහ ප්‍රචලිත කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීමට ක්‍රියා කෙරේ.

V1. එසේ කරනු ලබන පර්යේෂණ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට සහ සාමාන්‍යයෙන් සෙසු ආසියානු රටවල් වලට අදාල වන ගොවි කටයුතු සංවර්ධනයට සහ නවීකරණයට සම්බන්ධ ප්‍රශ්න වලට යොමු කිරීමට ක්‍රියා කෙරේ.

(5) <u>ඉඩම් සංවර්ධනය.</u>

(1) <u>ඉඩම් ප්‍රතිපත්තිය.</u>

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වන සම්පත් දෙපාර්තමේන්තුව සහ පලාත් සභා මඟින් කරගෙන යන්නා වූ ඉඩම් කටයුතු සහ පුද්ගලික අංශයට වරින් වර කරන ලද ඉඩම් පැවරීම් ආදියත් එකිනෙකට අසම්බන්ධවූ ක්‍රියාදාමයක් වශයෙන් ක්‍රියාත්මක වී ඇත. මීට අමතරව 1991 දී ජාතික ඉඩම් භාවිතය සහ බෙදා දීම පිළිබඳව ජනාධිපති කාර්ය සාධක කණ්ඩායමක් පත් කරන ලදී. එහි නිර්දේශද ක්‍රියාත්මක කරමින් 1992 මාර්තු වන විට ඉඩම් කට්ටි 2,83,131 ක් පවරා දී ඇත. මේ අයුරින් මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය අවුල් සහගත තත්ත්වයකට පත්ව ඇත. ඒ අවුල නිරවුල් කිරීමේ කාර්යය අවසන් කිරීමෙන් පසුව විධිමත් ඉඩම් ප්‍රතිපත්තියක් සම්පාදනය කෙරෙනු ඇත.

එහි ප්‍රමුඛත්වය ලැබෙන්නේ පාරම්පරික ගොවිතැනෙහි ඉදිරි අනාගතය සමෘද්ධිමත් කිරීමේ ජාතික ආර්ථික සංවර්ධනයේ අවශ්‍යතාවලටයි.

## (2) අළුත් ඉඩම් සංවර්ධනය.

අළුත් ඉඩම් සංවර්ධනය රජයේ ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා වන සම්පත් සංරක්ෂක ආදි රාජ්‍ය අධිකාරීන් යටතේ ඇති වගා කළ හැකි ඉඩම්ද පුද්ගලික අංශයේ පාළුවට ගොස් ඇති ඉඩම් පිළිබඳවද පුළුල් සමීක්ෂණයක් කෙරේ. ඒ සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව ලබා ගත හැකි නව ඉඩම් ආර්ථික ගොවි ඒකකයක් වශයෙන් පිහිටුවා සමෘද්ධි ව්‍යාපාරය යටතේ එම ඉඩම් සංවර්ධනය කෙරේ. ගොවිතැන් කරන ඉඩමෙහි වපසරිය අනුව එය ආර්ථිකශීලි ඒකකයක් වීම අනිවාර්ය වන බැවින් මෙම ඉඩම් සමූහ ගොවිපොළවල් හෝ පුද්ගලික ඒකකයක් වශයෙන් හෝ පිහිටුවිය යුතුද යනු ඒ ඒ අවස්ථාවන්හිදී මතුවන කරුණු මත තීරණය කෙරේ.

කෙසේ වෙතත් ධරණීය සංවර්ධන සංකල්පය අනුව පරම්පරාවෙන් පරම්පරාවට වුවත් ගොවිපල ආර්ථික ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීම සහතික වනු ඇත. ඒ අනුව ඉඩම් ලාභීන්ට අවශ්‍ය වූ විට ඒ ඉඩම් විකිණීමේ අවසරය ලැබෙන්නේ ගොවිපලෙහි සුරක්ෂිතභාවය සුරැකෙන අයුරින් නීති සම්පාදනයෙනි.

විවෘත ආර්ථිකය යටතේ ආර්ථික වර්ධනයත් සමග ඉඩම් ඉල්ලුම වැඩි වී ඇති බැවින් කෘෂිකර්මයම පමණක් නොව අවස්ථාවෝචිත පරිදි කාර්මික කටයුතු සහ පදිංචිය වැනි කාර්යයන්ට ඉඩම් සඳහා ඇති තරඟකාරී ඉල්ලුම හැකි පමණින් ගැලපෙන පරිදි ඉඩම් ප්‍රතිපත්තිය සකස්. කෙරේ.

සමූහ ගොවිපලවල් වල සමෘද්ධි සාමාජිකයින්ගේ අවශ්‍යතා ඉටු වූ පසුව හෝ ජාතික අවශ්‍යතාවයන් සඳහා ඉඩම් වල සාපේක්ෂ ආර්ථික වර්ධනය සැලකීමෙන් පසුව හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට වත්කම් සහිත පුද්ගලික ආයෝජකයින් සම්බන්ධ කර ගැනීමද සැලකුම් කෙරේ.

(3) <u>පාරම්පරික ඉඩම් සංවර්ධනය</u>.

අළුත් ඉඩම් සංවර්ධනයට සමාන්තරව පාරම්පරික ඉඩම් සංවර්ධනය සඳහා ඉඩම්වල භූක්තිය, වපසරිය හා වීදින බෝග වගාවන් සහ අඩු ඵලදාව එකින් එක සොයා බලා ප්‍රතිකර්ම යෙදවීම සැලසුම් කෙරේ. කෘෂිකර්මය යටතේ ඉහතින් සඳහන් කල සේවාවන් මේ සඳහා බලපානු ඇත. අවස්ථාවෝචිත පරිදි ඉඩම්වල පසෙහි ස්වභාවය ගොවීන්ගේ අභිමතය ආදී කරුණු මත බෝග විවිධාංගීකරණය ක්‍රියාත්මක කරනු ඇත.

ඉහතින් සඳහන් කල පරිදි කෘෂි යන්ත්‍රෝපකරණ සහ උපකරණ මාධ්‍යයෙන් ගොවි කටයුතු යාන්ත්‍රික කිරීම සිද්ධ කෙරේ.

(6) සත්ත්ව පාලනය.

ඉහත 2 වැනි කොටසෙහි සඳහන් 'ජාතික කෘෂිකාර්මික ආහාර සහ පෝෂණ උපාය මාර්ග සැලසුමෙහි' සත්ත්ව පාලනයට සාපේක්ෂ වශයෙන් වැඩි අවධානයක් යොමු කර තිබුණද එයින් අපේක්ෂා කළ පරිදි කිසිම අර්ථාන්විත වැඩක් සිදු වී නැති බව දැන් ප්‍රත්‍යක්ෂ වී ඇත. දැනට පවත්නා කිරි නිෂ්පාදනය බෙහෙවින් රඳා පවතින්නේ එළදෙනුන් දෙතුන් දෙනෙකු සිටින කුඩා සත්ත්ව පාලකයින් මත බව පිළිගත් කරුණකි.

දිවයින තුල වර්ෂයකට කිරි ලීටර් මිලියන 200 සිට 240 දක්වා නිෂ්පාදන හැකියාවක් ඇතැයි ගණන් බලා ඇත. එනමුත් 1993 දී සංවිධානාත්මක කිරි එකතු කිරීම මගින් එකතු කළ කිරි ප්‍රමාණය ලීටර් මිලියන 92.7 කි. එනම් පවත්නා ශක්‍යතාවෙන් 30 - 35 ක ප්‍රතිශතයකි. සියයට 15 සිට 20 දක්වා කිරි එක්කෝ පරිභෝජනයට හෝ වෙනත් ආහාර නිෂ්පාදන වලට ගත්විට සියයට 50 ක් පමණ නිෂ්පාදන හැකියාව අපතේ යයි.

කිරි මිළ රඳා පවතින්නේ කිරි නිෂ්පාදනය සඳහා සෑෙන රාජ්‍ය ආධාරයන් ලැබෙන කාර්මික රටවල් වල කිරි මිළ අනුවයි. කිරි ලීටරයක සාමාන්‍ය මිළ රු.10.54 ක් වුවද නිෂ්පාදකයාට ලැබෙන්නේ රු.4.50 සිට රු.7.00 දක්වා උපරිම මිළකි. කිරි මිළදී ගැනීමේදී පෝෂ්‍ය පදාර්ථය අනුව මිළ නිගමනය කෙරෙන බැවින් අතරමැදියා මෙහිදී විශාල ලාභයක් ලබයි. මේ පිළිබඳව පූර්ණ ගවේෂණයක් කර අවශ්‍ය ප්‍රතිකර්ම සැලසීම යෝජනා කෙරේ.

කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වර්ෂයකට රුපියල් බිලියන 3.5 ක් පමණ වැය වන බව ගණන් බලා ඇත. කිරිපිටිවල ජනප්‍රිය භාවය සහ ඒ සඳහා කෙරෙන ආකර්ෂණීය ප්‍රචාර දැන්වීම් මෑතකදී සිට පවතින ප්‍රබල ප්‍රවණතාවයකි. දැනට මෙම ප්‍රචාර මාධ්‍යය විසින්

පෝෂණය කෙරෙන කිරි පිටි ආනයනය වසරකට මෙට්‍රික් ටොන් 30,000 ක් සිට 35,000 දක්වා ප්‍රමාණයකි. ඒ අනුව දේශීය කිරි නිෂ්පාදනය ක්‍රමානුකූලව වර්ධනය කල යුතු අතර එහි සාර්ථකත්වයේ අනුපාතයට අනුකූලව කිරි ආනයනය කිරීම අඩු කළ යුතුය.

කිරි පට්ටි පාලනයේ පස් අවුරුදු සැලැස්මක් ජාතික සත්ත්ව පාලන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කෙරේ. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පිරිවැය සහ සෙසු සම්පත් ලබා දීමට ක්‍රියා කරනු ඇත.

(7) <u>ග්‍රාමීය මූල්‍ය ආයතනය</u>.

කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම සඳහා ග්‍රාමීය මූල්‍ය ආයතනයක් පිහිටවනු ලැබේ. ගොවි ණය පහසුකම් සැලසීමේ අතීත අත්දැකීම වනුයේ ඒ ඒ අවස්ථා වලදී පැන නඟින සාධකයින් මත ගොවි ණය කපා හැරීමයි. මෙය ආර්ථික ප්‍රතිපත්තීන්ට පටහැනි ක්‍රියාවක් වන බැවින් දැනට උද්ගතව ඇති තත්ත්වයන් යටතේ ගොවි ණය කපා හැරියද රාජ්‍ය ප්‍රතිපත්තිය වනුයේ ගොවියා ද අන්‍ය ව්‍යවසායිකයන් මෙන්ම ණය පහසුකම් ලබා ගනිමින් ඒවා ගෙවීමට ශක්තියක් ඔහු තුළ ඇතිකරවීමයි. ඔහුගේ ගෞරවාන්විත වෘත්තියමය තත්ත්වය පුරක්නේ එවැනි ප්‍රතිපත්තියකිනි. ඒ නිසා යෝජිත ග්‍රාමීය මූල්‍ය ආයතනය මගින් ගොවිතැන ලාභදායක වෘත්තියක් කරවීමේ අභිප්‍රාය ඇතිව ඒ සඳහා අවශ්‍ය පසුතල පහසුකම් සලසනු ලැබේ. ගොවි උපකරණ, පලිබෝධ නාශක, පොහොර, බීජ සහ රෝපණ ද්‍රව්‍ය, ප්‍රවාහනය සඳහා අවශ්‍ය වාහන ආදි වශයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ වලට බදු සහන සහ ඒ භාණ්ඩවල දේශීය නිෂ්පාදන සුලභ කිරීමත්, ගොවිතැනට අවශ්‍ය ඉඩම් ලබා ගැනීම සඳහා ණය පහසුකම් ආදිය සැලසීම කෘෂි රක්ෂණය ආදි විවිධ ක්‍රියාමාර්ගයන් ගෙන් පූර්ණ වූ අවශ්‍ය පසුතල පහසුකම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා පස් අවුරුදු සැලැස්මක් සකස් කෙරේ. එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ධනය සහ සෙසු පහසුකම් සැලසේ. සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කෙරේ.

වෙළඳ ව්‍යාපාරිකයා , තේ හෝ රබර් වතු හිමියා හෝ සෙසු ව්‍යවසායිකයාද විවිධ මාර්ග වලින් රාජ්‍ය අනුග්‍රහය ලැබුවද ඔවුන්ගේ රැකියා ගරුත්වය සමාජය පිළිගත්තේ ඔවුන් පසුබිමෙහි ඇති සමාජ-ආර්ථික සහ සංස්කෘතික ශක්තිය නිසාය. එවැනි පසුබිමක් ගොවියාටද ලබා දීම රාජ්‍ය ප්‍රතිපත්තිය වනු ඇත. එබැවින් මෙම විශේෂ ග්‍රාමීය මූල්‍ය ආයතනයේ සෙසු මූල්‍ය ප්‍රතිපත්තීන් අතර, ඉහත සඳහන් සමාජ-ආර්ථික සංස්කෘතික පසුබිම සම්පාදනය කිරීම විශේෂ අංගයක් වනු ඇත.

(8) <u>සහභාගීත්ව ජල කළමනාකාරිත්වය.</u>

ගොවි සංවිධාන සහ එමගින් ගොවීන් සමග සහභාගීත්ව ජල කළමනාකාරිත්වය ( Participatory Water Management ) ආරම්භ වූයේ 1970 දශකයෙහිදීය. එහි ප්‍රථම අවස්ථාව නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආරම්භ කල මහනුවර මීතිපේ ජල කළමනාකරණ ව්‍යාපෘතියයි. මින් පසුව විවිධ රාජ්‍ය නොවන ආයතන මීට අතගැසූ අතර, ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය ගල්ඔය ජල කළමනාකරණයෙහිදී ආයතන සංවිධායකයින්ගේ සහාය ලබා ගත්තේය.

ග්‍රාමීය වාරිමාර්ග පද්ධතියෙහිදී ගොවීන්ගේ සහභාගීත්වය නොඅඩුව ලැබුණද මහා වාරිමාර්ග පද්ධතීන් කළමනාකරණයට ගොවීන්ගේ සහභාගීත්වය නොලැබුණේ ඒවාහි විශාලත්වය, ජනපද ක්‍රමය, ගොවීන්ට ඉඩම් බෙදීම ආදී විවිධ කලමනාකරණ හේතූන් නිසාය. මෙහදී සිදුවූයේ ගොවීන්ට රජය කෙරෙහි බලාපොරොත්තු තබා ගෙන සිටීමටයි. මේ පසුබිම යටතේ කළමනාකරණ වැය අඩු කිරීමට රජය බලවත් ප්‍රයත්නයක් දැරූවද එය අසාර්ථක වීමේ හේතුවෙන් ගොවීන්ගේ සහභාගීත්වය සෑම හැකි අවස්ථාවකදීම ලබා ගැනීමට රජයට සිදු විය. ජලබදු අයකිරීම, 1971-78 වකවානුව තුල ස්ථාපිත කල ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය ( Territorial Civil Engineers Organization - TCEO ) ආදියෙහි අත්දැකීමෙන් පසු 1988 දී සහභාගීත්ව කළමනාකරණය ප්‍රතිපත්තියක් වශයෙන් රජය පිළිගත් නමුදු එය එවක තිබුණු ඉඩම්, වාරිමාර්ග සහ

මහවැලි සංවර්ධන අමාත්‍යාංශයටත් ඊට අඩු පරිමාණයකින් කෘෂිකර්ම සංවර්ධන සහ පර්යේෂණ අමාත්‍යාංශයටත් සීමා විය. මේ තත්ත්වය මග හරවා ගැනීමට 1979 අංක 58 දරණ ගොවි ජන සේවා පනත සංශෝධනය කරන්නට සිදුවිය. මෙයින් ගොවි සංවිධාන වලට වෙනත් ආයතන සමග කටයුතු කරමින් තම අරමුණු ඉටු කර ගැනීම සඳහා නීතිමය බලය ලැබිනි. එහෙත් එය අදාල අමාත්‍යාංශවල ආයතන සමග කටයුතු කිරීමෙහිදී පමණක් ක්‍රියාත්මක වූ බැවින් සහභාගිත්ව ජල කළමනාකරණය ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් ස්ථාපිත වූයේ නැත. එබැවින් ගොවියා ගම්මට්ටමේ සෙසු සංවිධාන සහ රාජ්‍ය නොවන ආයතන හා සම්බන්ධ වන විට මෙය ක්‍රියාත්මක වුයේ නැත. මේ තත්ත්වය අධ්‍යයනය කර සහභාගිත්ව ජල කළමනාකරණය පොදු ප්‍රතිපත්තියක් බවට පරිවර්තනය කර එය අධීක්ෂණය කිරීමට සැලසුම් කෙරේ.

(9) <u>අලෙවිය.</u>

1. වී/සහල්.

නිෂ්පාදන අවස්ථාවේදී වී මිලයට ගනු ලබන ක්‍රම දෙකක් ඇත. ප්‍රථමයෙන්ම වී එකතු කරන්නන් ගොවියාගෙන් වී මිළයට ගෙන වී මෝල් හිමියන්ට විකුණනු ලැබේ. දෙවනුව වී එකතු කරන්නන්ගේ සහාය නොමැතිව මෝල් හිමියන් විසින් කෙළින්ම ගොවියාගෙන් වී මිළයට ගනු ලැබේ. වී එකතු කරන්නා බොහෝ විට ගොවියා සමග සමීප සම්බන්ධතාවක් තබා ගන්නේ ඔහුට අවශ්‍ය ණය මුදල් සපයා දීමෙනි. මුල්‍ය ආධාර පමණක් නොව කුඹුරට අවශ්‍ය යෙදවුම් වන පොහොර, පළිබෝධ නාශක සහ ගෙදර දොරට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ පවා ඔහු විසින් සපයන අවස්ථා ඇත.

දැනට තිබෙන වී මෝල් 7000 ක පමණ සහල් තොග වෙළඳ පොළට විකුණනු ලබන්නේ සියයට 5 ක කොමිස් මුදලකටයි. දැනට එවැනි තොග වෙළඳුන් 70 ක් පමණ සිටින අතර, එයින් 15 ක් පමණ විශාල තොග වෙළෙන්දෝයි.

ඔවුන්ගේ දෛනික වෙළඳාම මෙට්‍රික් ටොන් 30 -35 ක් අතර ගණනකි. පිටකොටුව හැරෙන්ට මහනුවර කුරුණෑගල වැනි ප්‍රධාන නගරවලද තොග වෙළෙන්දන් ඇත. සාමාන්‍ය වෙළඳ පලට සහල් ලැබෙන්නේ මේ තොග වෙළඳුන් මාර්ගයෙනි.

රාජ්‍ය සහල් වෙළඳ පලෙහි වී අලෙවි මණ්ඩලයත්, විවිධ සේවා සමුපකාර සමිතිත් වී මිළයට ගන්නේ අස්වනු ලැබෙන කාලයේදී පමණි. එයද මුල්‍ය සම්පත් අනුව වෙනස් වේ. වී අලෙවි මණ්ඩලය පිහිට වූ ආරම්භයේදී වී මිළයට ගැනීමේ පූර්ණ අයිතිය මණ්ඩලය සතුව තිබුණද පසු කාලයේදී මණ්ඩලයෙන් සිද්ධ වූයේ වී අලෙවියෙහි සහතික මිළක් ස්ථාපිත කිරීම පමණි. ගොවියන් පුද්ගලික තැරැව්කාරයින්ට වී විකුණන්ට මනාපයක් දක්වන්නේ ඔවුන්ගේ කුඹුරට/නිවසට අවුත් වී එකතු කරන නිසාත් ණය මුදල් ආදි පහසුකම් ලැබෙන නිසාත්ය.

(2) <u>එලවළු සහ පලතුරු.</u>

සහල් හැරෙන විට එලවළු සහ පලතුරු, වෙළඳ පලෙහි ප්‍රධානතම ස්ථානයක් ගන්නා නිෂ්පාදනයකි. එලවළු සහ පලතුරු අස්වැන්නෙන් පසුව දින කිහිපයක් ඇතුලතදී ඒවා අලෙවි කළයුතු බැවින් ඒ ගැන ගොවියා සහ වෙළෙන්දා විශේෂ අවධානයෙන් සිටිත්. ප්‍රධාන වශයෙන් කොමිස් තැරැව්කාරයාද එකතු කරන්නාද පලතුරු සහ එලවළු මිළයට ගනී. ඒ හැරෙන්ට සතිපතා පොල මේ සඳහා යොදා ගනු ලැබේ. පිටකොටුවේ පමණක් එලවළු වෙළෙන්දන් 450 ක් පමණ සිටී. මෙයින් අඩක් පමණ තොග වෙළෙන්දන් වන අතර, ඉතිරි අය තොග සහ සිල්ලර වෙළෙන්දෝය. පලතුරු තොග වෙළෙන්දන් 70 ක් පමණද සිල්ලර සහ තොග වෙළෙන්දන් 10 දෙනෙක් පමණ සිටී. මේ හැරෙන්ට නුවර සහ දඹුල්ල නගරවල තොග වෙළෙන්දන් කිහිප දෙනෙක් ඇත. එනමුත් සමස්ත පලතුරු සහ එලවළු අලෙවිය බෙහෙවින් රඳා පවතින්නේ

එකතු කරන්නන්ගේ මහා සංවිධානය මතයි. එම සංවිධානය සකස් වී ඇත්තේ මුළු වෙළඳ ව්‍යුහය පාලනය කර ගැනීමේ අපේක්ෂාවෙනි.

එලවළු සහ පලතුරු කල් තබා ගැනීමේ තාක්ෂණය එතරම් දියුණු තත්ත්වයක නැති නිසා මුළු නිෂ්පාදනයෙන් එසේ කල්තැබීම් සඳහා වෙන් වන්නේ සියයට 10 ක් පමණි. මේ තත්ත්වය යටතේ කල් තබා ගැනීමේ තාක්ෂණය වර්ධනය කිරීමට සැලසුම් කිරීම අපේක්ෂා කෙරේ.

අලෙවියට අදාල වන ගුණක සඳහන් කරුණු සහ ඊට අනුෂාංගික සියළුම සාධකයන් ගැන පූර්ණ අධ්‍යයනයක් මෙතෙක් සිදුවී නැත. එවැනි ගැඹුරු අධ්‍යයනයකින් පසුව නිෂ්පාදනය, අලෙවිය, පරිභෝජනය යන ත්‍රිවිධ අවස්ථාද නිර්යාත අලෙවිය ... විධිමත් කිරීම අපේක්ෂා කෙරේ. මහා වීකිණීමේ ක්‍රමයක් ඇති කිරීම එහි ප්‍රධාන අරමුණයි.

(10) <u>කෘෂිපාදක කර්මාන්ත.</u>

සාම්ප්‍රදායික වශයෙන් අතීතයේදී ගොවිතැන සඳහා උදළු, පොරෝ වැනි ආයුධ ඒ ඒ ප්‍රදේශවල නිපදවා ඇත. එපමණක් නොව ට්‍රැක්ටර් සහ වී කොටන යන්ත්‍ර සඳහා අවශ්‍ය අමතර කොටස් පවා ඒ ඒ පලාත්වල සම්ප්‍රදායික කාර්මිකයන් විසින් නිපදවන ලදී. මේ ප්‍රවණතාවය අඩුවෙන්ට අඩුවෙන්ට ඒ කාර්මිකයින්ගේ රැකියා නියුක්තිය අඩුවුවා පමණක් නොව කෘෂි නිෂ්පාදනවල මිල අධිකවන්ට විය.

සිංහල ගොවියා සතු මෙවැනි සම්ප්‍රදායික නිෂ්පාදනක් පාරම්පරික ගොවිතැන් ක්‍රම, සිරිත් විරිත් සහ එම සංස්කෘතියක් ආරක්ෂා කර එය පෝෂණය කරනඅතරම නව තාක්ෂණයෙන් ඊට ලබා ගත හැකි ආභාෂය ගැන සමීක්ෂණය කෙරෙනු ඇත. එහි සුසංයුතියෙන් සකස් කෙරෙන පස් අවුරුදු සැලැස්ම ක්‍රියා කිරීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන සහ සෙසු සම්පත් සැපයෙනු ඇත.

## ( 11 ) වන සම්පත්.

ස්වාභාවික වන සම්පත් වලින් මේ රට අනූනව තිබූ අවධියේදී වන සම්පත් සංරක්ෂණය ගැන එතරම් අවධානයක් නොතිබිණි. එනමුත් ඒ සම්පත් කාලයාගේ ඇවෑමෙන්ද අධි තාක්ෂණයට සම්බන්ධ කර්මාන්ත ආදියෙහි වර්ධනයත් සමගද ක්ෂය වීමේ හේතුවෙන් වන සම්පත් සංරක්ෂණය ආරක්ෂා කිරීම අද ධරණීය සංවර්ධනයෙහි ප්‍රමුඛතාවය ලබන වැදගත් අංශයකි.

ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය සඳහා වූ කෙටුම්පත් යෝජනාවලියක් දැනටමත් සකස් කර ඇත. එය අවශ්‍ය සංශෝධනයන් සහිතව අනුමත කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය වන මූල්‍ය සම්පත් සහ මානව සම්පත් සැපයීම රාජ්‍ය වගකීම වනු ඇත.

අධ්‍යක්ෂ.

දිනය: 03.11.94. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

ඇමුණුම. 1

ස්ථාවර මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදන
වහුහයේ වෙනස්වීම් 1985–1991

| ප්‍රතිශත සංයුතිය. | 1985 | 1987 | 1989 | 1991 |
|---|---|---|---|---|
| 1. කෘෂිකර්මය. | | | | |
| තේ | 2.5 | 2.4 | 2.2 | 2.3 |
| රබර් | 0.8 | 0.7 | 0.6 | 0.5 |
| පොල් | 3.5 | 2.6 | 2.6 | 2.1 |
| තේ, රබර්, පොල් සැකසුම් | 3.0 | 2.9 | 2.7 | 2.8 |
| වැවිලි කර්මාන්තයේ එකතුව | 9.7 | 8.5 | 8.1 | 7.7 |
| වී | 6.2 | 4.7 | 4.3 | 4.7 |
| වෙනත් කෘෂිකර්ම | 12.9 | 13.4 | 13.0 | 13.3 |
| මුළු කෘෂිකර්මය | 28.8 | 26.5 | 25.4 | 25.6 |
| 2. පතල් සහ කැනීම් | 2.3 | 2.7 | 2.9 | 2.6 |
| 3. නිෂ්පාදන | 11.8 | 13.3 | 14.2 | 14.9 |
| 4. ඉදිකිරීම් | 7.4 | 7.2 | 7.0 | 6.6 |
| කර්මාන්ත එකතුව | 21.5 | 23.2 | 24.1 | 24.1 |
| 5. උපයෝගිතාවන් | 13.0 | 12.9 | 12.7 | 12.6 |
| 6. වෙළඳාම | 20.9 | 21.1 | 21.0 | 21.0 |
| 7. බැංකු රක්ෂණ හා දේපල | 4.5 | 4.7 | 5.1 | 5.2 |
| 8. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක | 4.0 | 4.7 | 5.0 | 4.8 |
| 9. වෙනත් සේවා | 7.2 | 6.8 | 6.7 | 6.7 |
| සේවා එකතුව | 49.7 | 50.3 | 50.5 | 50.3 |
| 10. ද.දේ.නි. | 100 | 100 | 100 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා සහ සමාලෝචනයන්හි විවිධ කාණ්ඩ.

## පාරිභාෂික වචන සහ පාඨ.

Acts
පනත්

Degradation
යෝදායාලුව

Development Sectors
සංවර්ධන අංශයන්

GDP - Gross Domestic Product
දළ.දේ.නි. - දළ දේශීය නිෂ්පාදිතය.

Innovative Modalities
නව නිර්මාණ සැලසුම්

Inputs
යෙදවුම් .

Institutional Planning
ආයතනික අංශ සැලසුම

Macro-economic and Sectoral Policies
සාර්ව ආර්ථික හා අංශයිය ප්‍රතිපත්තිත්

Macro Survey
සාර්ව සමීක්ෂණය

Micro Survey
සුක්ෂම සමීක්ෂණය

National, Agriculture, Food and Nutrition Strategy (NAFNS)
ජාතික, කෘෂිකාර්මික, ආහාර සහ පෝෂණ උපාය මාර්ග

Ordinances
ආඥාපනත්

Participatory Water Management
සහභාගිත්ව ජල කළමනාකාරිත්වය

Strategy Formulation
උපාය මාර්ග සංග්‍රහය

Subsidiary Legislation
උපකාරක නීති

Sustainable Development
ධරණීය සංවර්ධනය

Territorial Civil Engineers Organization - TCEO
ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය